**තමන්කඩුව ප්‍රාදේශීය සභාව**
**පොළොන්නරුව දිස්ත්‍රික්කය**
**--------------------------------**

## 1 මූල්‍ය ප්‍රකාශන
**----------------**

### 1.1 මූල්‍ය ප්‍රාකාශන ඉදිරිපත් කිරීම
---------------------------------

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 29 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2016 අප්‍රේල් 04 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2017 ජූනි 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

### 1.2 <u>තත්ත්වාගණනය කළ මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට තමන්කඩුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
--------------------------

ගබඩා ද්‍රව්‍ය සම්බන්ධයෙන් ගබඩා අත්තිකාරම් ගිණුම් ක්‍රමය අනුගමනය කර නොතිබුණි.

#### 1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවට අයත් ඇතුමල්පිටිය පෙර පාසැල් ගොඩනැඟිල්ල සංවර්ධනය කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දරන ලද රු. 177,403 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා ශ්‍රවනාගාරය, බැදිවැව ශ්‍රවනාගාරය හා බැදිවැව ආයුර්වේදය සඳහා තිර රෙදි දැමීමට වැය කරන ලද රු. 220,850 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ ව්‍යාපෘති සඳහා ලැබිය යුතු ණයගැති ශේෂ 06 ක වටිනාකම රු. 850,000 ක් ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඈ) සභාව සතු ට්‍රැක්ටරයක වටිනාකම රු. 50,000 ක් අඩුවෙන්ද හා ගලි බවුසරයක වටිනාකම රු. 900,000 ක් වැඩියෙන්ද දක්වා තිබුණි.

(ඉ) සභාව සතු නවනගරය කඩ කාමර 04 හා ඉඩමේ වටිනාකම රු. 7,050,000 ක් වුවද එය රු. 705,000 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා වත්කම් වල අගය රු. 6,345,000 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) සභාව සතු පොළොන්නරුව සතිපොල භූමියේ වැසිකිළි පද්ධතිය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු. 264,898 ක මුදල ප්‍රාග්ධනිත කර නොතිබුණි.

#### 1.3.3 නොසැසඳුනු පාලන ගිණුම්
-----------------------------

ගිණුම් විෂයයන් 2 කට අදාළ උපලේඛණවල දැක්වෙන ශේෂයන්ගේ වටිනාකම් හා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්ගේ වටිනාකම් අතර රු. 2,331,496 ක වෙනසක් නිරීක්ෂණය විය.

#### 1.3.4 ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ලැබිය යුතු ගිණුම් ශේෂ 03 කට අදාළ එකතුව රු. 20,876,050 ක් වූ මුදල 2002 වර්ෂයේ සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණු අතර වැටුප් ප්‍රතිපූර්ණ රු. 1,715,017 ක ශේෂයක් 2014 වර්ෂයේ සිට නිරවුල් නොකර පැවතුණි.

1.3.5 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම

---

මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් විෂයයන් 18 ක වටිනාකම වූ රු. 635,665,589 කට අදාළ අයිතිය තහවුරු කිරීමේ ලේඛන, සමීක්ෂණ මණ්ඩල වාර්තා හා විස්තරාත්මක උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස පරීක්ෂා කිරීමට නොහැකි විය.

1.3.6 නීතී රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවීම

---

පහත දැක්වෙන නීතී රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීතී, රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනත | |
| (i) | 149 වගන්තිය | සභා බල ප්‍රදේශයේ පිහිටා ඇති සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 06 කින් 2016 වර්ෂය සඳහා ගාස්තු අයකර නොතිබුණි. |
| (ii) | 150(1), 152(1) හා 153(1) වගන්තිය | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර වෘත්තීන් සහ සංවර්ධනය නොකරන ලද ඉඩම් පිළිබඳ වූ ලැයිස්තු පිළියෙල කර වර්ෂයේ මාර්තු 31 දින හෝ ඊට ප්‍රථම සභාවේ ලේකම්වරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) | 1988 අංක 56 දරන ජාතික පාරිසරික පනත | සභාවට පැවරී ඇති බලතල අනුව බල ප්‍රදේශයේ පිහිටා ඇති ව්‍යාපාර 31 කට පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා දීමට කටයුතු කර නොතිබුණු අතර ව්‍යාපාර 05 ක ඉකුත් වී ඇති බලපත්‍ර පිළිබඳව පසු විපරම් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 1988 ප්‍රාදේශිය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාව | . |
| (i) | 193 රීතිය | එක් එක් ආදායම් විෂයය යටතේ වන අයවැයගත මුල්‍ය ප්‍රතිපාදන හා පරිපූරක සම්මත හා සසඳා අතිරික්තයන් හෝ වියදම් නොකොට ඉතිරිව ඇති ශේෂය පිළිබඳව කරුණු පැහැදිලි කරන ප්‍රකාශයක් සෑම වර්ෂයකම අවසානයට පිළියෙල කර විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි |

| | | |
|---|---|---|
| (ii) | 214 රීතිය | 2017 අප්‍රේල් මාසය වන විටත් 2016 වර්ෂය සඳහා වූ සභාවේ දේපල හා භාණ්ඩ පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණු අතර, වර්ෂ ගණනාවක සිට සභාවට අයත් පුස්තකාල 4 ක පොත් පිළිබඳව සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය<br>-------------------------------------- | |
| (i) | මු.රෙ. 104 | 2012 වර්ෂයේ සිදුවූ වාහන අනතුරක් සම්බන්ධව ප්‍රාරම්භක පරීක්ෂණයක් කර නොතිබුණි. |
| (ii) | මු.රෙ.110 | වාහන අනතුරු සම්බන්ධයෙන් හානි ලේඛණයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ xxiv වන පරිච්ඡේදයේ 4.5 වගන්තිය | ස්ථානමාරු වී ගිය නිලධාරීන් 4 දෙනෙකුගෙන් දීර්ඝ කාලයක සිට අයවිය යුතු හිඟ ණය ශේෂය රු. 96,185 ක් අයකර ගෙන නොතිබුණි. |
| (ඊ) | චක්‍රලේඛ හා ලිපි<br>------------------<br>1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/40 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය<br>----------------------------------- | |
| (i) | 02 ඡේදය | සභාව සතු කඩ කාමර 240 ක් සම්බන්ධයෙන් වසර 05 කට වරක් කඩ කුලී සංශෝධනය නොකර 2008 වර්ෂයේ සිදුකර තිබුණු සංශෝධන අනුව සමාලෝචිත වර්ෂයේදීද ගාස්තු අයකර තිබුණි. |
| (ii) | 07 ඡේදය | බදුකරු විසින් කඩ කාමර අතුරු බදු දිය නොහැකි වුවද සභාව සතු කාමර 05 ක් රු. 15,000 සිට රු. 20,000 දක්වා අතර කුලියකට අතුරු බදුදී තිබුණි. |

**02.** **මූල්‍ය සමාලෝචනය**

--------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

-------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 24,976,586 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 28,972,672 ක් විය.

2.2. ආදායම් පරිපාලනය

------------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

-----------------------------------------------------------------

සභාවේ ලේකම් විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | 2016 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,560,600 | 11,816,970 | 13,622,124 |
| (ii) | බදු කුලී | 17,360,045 | 19,027,484 | 1,428,817 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 2,210,000 | 5,463,243 | - |
| (iv) | වෙනත් ආදායම් | 43,094,650 | 34,541,341 | 24,481,277 |

2.2.2 වරිපනම් හා බදු

------------------

වර්ෂයේ බිල් කිරීම්ද සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු රු. 19,295,950 න් අයකරගෙන තිබුණේ රු. 8,223,600 ක් හෙවත් සියයට 43 ක් පමණි.

2.2.3 කඩකුලී

----------

සභාව සතු කඩ කාමර බදු දීමේදී ගිවිසුම ප්‍රකාරව ටෙන්ඩරය පිළිගත් දින සිට දින 14 ක් ඇතුළත ප්‍රධාන මුදල් (කී මනී) ගෙවා අවසන් කළ යුතු වුවද කඩ කාමර 28 කින් ලැබිය යුතු රු. 1,142,674 ක මුදල වසර 10 කට අධික කාලයක සිට හිඟ හිට තිබුණි.

2.2.4 වෙනත් ආදායම්

--------------------

(අ) සභාව සතු සිංහපුර පානීය ජල ව්‍යාපෘතියේ ජල පාරිභෝගිකයන්ගෙන් අයවිය යුතු ජල ගාස්තු 2014 වර්ෂයේ සිට හිඟහිටව තිබුණු නමුත් එම ගාස්තු අයකර ගැනීමට ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) තමන්කඩුව බල ප්‍රදේශයේ පවත්නා ත්‍රීරෝද රථගාල් වලින් ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි

2.2.5 උසාවි දඩ

------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගතයුතු උසාවි දඩ අදායමෙන් රු. 8,107,856 ක් හෙවත් සියයට 48 ක් හිඟව පැවතුණි.

2.2.6 මුද්දර ගාස්තු

----------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකරගතයුතු රු. 10,473,643 ක් වූ මුද්දර ගාස්තු ආදායමින් කිසිදු මුදලක් රැස්කරගෙන නොතිබුණි

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාවේ සේවයේ නියුතු ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් 38 දෙනෙකු අතරින් 08 දෙනෙකුගේ පැමිණීම මාසයකට දින 02 සිට 12 දක්වා ඉතා දුර්වල මට්ටමක පවතින බැවින් සභාවේ ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය වැනි අත්‍යවශ්‍ය සේවා පවත්වාගෙන යාමට මේ තත්ත්වය බලපා තිබුණි.

(ආ) සභාව සතු පොළොන්නරුව රෝහල හංදියේ දෙමහල් කඩ කාමර 05 ක් හා තනි මහල් කඩ කාමර 07 ක් සඳහා සභාව මඟින් බදු ගැණුම්කරු සමඟ ගිවිසුම් ඇති කර ගෙන නොතිබුණු අතර කඩ කාමර 06 ක ගිවිසුම් අසම්පූර්ණ විය.

(ඇ) කඩ කාමර බදු දීමේදී ඇති කරගත් බදු ගිවිසුම අනුව මාසික කුලිය අඛණ්ඩව මාස 03 ක් පැහැර හැරියහොත් බදු ගිවිසුම අහෝසි කර හිඟ මුදල් අයකර ගැනිමට කටයුතු කළ යුතු වුවද සභාවට අයත් කඩ කාමර 19 කින් අයවිය යුතු කඩ කුලී මාස 03 සිට මාස 13 ක් දක්වා හිඟ හිටව තිබුණි.

(ඈ) සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 4 ක අයිතිය සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ඉඩම් 12 ක අයිතිය තහවුරු කර ගැනිම සඳහා ඉඩම් කොමසාරිස් ජනරාල් වෙතින් රජයේ ඉඩම් පිළිබඳ සහතික ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සේවය හැර ගිය කාලය නිශ්චිතව හඳුනා නොගත් ආදේශක සෞඛ්‍ය කම්කරුවන් 07 දෙනෙකුගෙන් අයවිය යුතු හිඟ ණය ශේෂය රු. 17,600 ක් විය.

(උ) තමන්කඩුව ආයුර්වේද මධ්‍යස්ථානයේ සායනය සඳහා පැමිණි රෝගීන් ගණන වාර්ෂිකව අඩුවන තත්ත්වයක් නිරීක්ෂණය වූ අතර ඖෂධ වර්ගවල ඌනතාවයක් පැවතිම මේ තත්ත්වයට හේතු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ආයුර්වේද ඖෂධ සඳහා ප්‍රතිපාදන අනුව රු. 300,000 ක් වෙන්කර තිබුණද, ඉන් වැයකර තිබුණේ රු. 143,300 ක් හෙවත් සියයට 47 ක් පමණි. .

(ඌ) සමාලෝචිත වර්ෂයේදී තෘතියික මට්ටමට අයත් ලේකම් හා ස්ථානභාර නිලධාරී තනතුර සහ ද්විතියික මට්ටමට අයත් සංවර්ධන නිලධාරී, ගිණුම් සහකාර, පුස්තකාලාධිපති, තාක්ෂණ නිලධාරී, වැඩ පරීක්ෂක, ආදායම් පරීක්ෂක, සෞඛ්‍ය පරීක්ෂක, ගිණි බට, යන්ත්‍ර ක්‍රියාකරු යන තනතුරුවලද පුරප්පාඩු 28 ක් පැවතුණි.

(එ) අනුමත කාර්ය මණ්ඩලයට අමතරව ආදේශක පදනම මත පළාත් පාලන කොමසාරිස්ගේ ලිඛිත අනුමැතියකින් තොරව සේවකයින් 12 දෙනෙකු බඳවාගෙන සහා අරමුදලින් රු. 3,120,700 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

රජරට නවෝදය ක්‍රීඩාංගනයේ කොටසක ඉදිකරන ලද ළමා උද්‍යානයේ සවිකර ඇති ක්‍රීඩා උපකරණ ඉන්වෙන්ට්‍රි ලේඛණයකට ගෙන නොමැති අතර නිලධාරියෙකුගේ භාරකාරිත්වයකින් තොරව අනාරක්ෂිතව පවතින බවත් කිසිදු නඩත්තුවක් සිදු නොවන බවත් නිරීක්ෂණය විය.

### 3.3 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) සභාව සතු බැංකු ගිණුම් තුනක එකතුව රු. 1,034,634 ක් වූ ශේෂයන් වර්ෂ කිහිපයක සිට අක්‍රීයව පැවතුණි.

(ආ) සභාව සතු රු. 5,310,755 ක වත්කම් අයිතම 6 ක් වසර 3 සිට 5 දක්වා කාල පරාසයක් තුල කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ අවසානයට සභාවේ අතැති තොග ශේෂය තුල රු. 64,347 ක වටිනාකමැති නළ ළිං උපකරකරණ තොග ශේෂයක් 2008 වර්ෂයේ සිට භාවිතයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි.

(ඈ) 2013 වර්ෂයේදී ට්‍රැක්ටර් සංස්ථා ගොඩනැඟිල්ල සභාවට පවරා ගන්නා අවස්ථාවේදී පවරා ගත් විවධ වත්කම් වර්ග 38 ක් හා ට්‍රැක්ටර් භාණ්ඩ ඒකක 147 ක් නිෂ්කාර්යව සභාවේ රඳවාගෙන තිබුණි.

### 3.4 හඳුනාගත් අලාභ

සභාව සතු බැදිවැව ලීලාරත්න විජේසිංහ ශ්‍රවනාගාරය කුලියට දීමේදී සමාලෝචිත වර්ෂයේ අවස්ථා 27 කදී අයකළ යුතු රු. 135,000 ක මුදල් අයකරගෙන නොතිබුණි.

3.5 සන අපද්‍රව්‍ය කළමනාකරණය
---------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දිනකට එකතුවන කසල ටොන් 9 ක් 10 ක් පමණ ප්‍රමාණයක් කසල වර්ගීකරණයකින් තොරව එකතුකර පොදුවේ කසල ප්‍රතිචක්‍රීයකරණ මධ්‍යස්ථානය වෙත ගෙන ඒමෙන් පසු නැවත වර්ගීකරණය කිරීම නිසා වර්ගීකරණය සඳහා කම්කරුවන් 05 දෙනෙකුට ගෙවන වැටුප නිෂ්කාර්ය වියදමක් වී තිබුණි.

(ආ) කොම්පෝස්ට් බවට පත්කරන ලද කැලි කසල අලෙවිය සඳහා සූදානම් කිරීමට පෙර ඒවා හැලීම සඳහා වන දැල් උපකරණ සකස් නොකිරීම මත කොම්පෝස්ට් බවට පත්කළ කැලි කසල කඳු වශයෙන් ගොඩගසා තිබුණි.

(ඇ) සභා බල ප්‍රදේශයේ ඉවත් කළයුතු වැසිකිළි අපද්‍රව්‍ය සෞඛ්‍ය ආරක්ෂිතව ඉවත් කිරීම සඳහා සුදුසු ක්‍රියාවලියක් හා බැහැර කිරීම සඳහා සුදුසු භූමියක් නොමැති බැවින් සභාවේ වගකීම් පැහැරහැරීමක් මෙන්ම සභාවට අයකළ හැකි ආදායමක් අහිමි වී තිබුණි.

4. **පද්ධති හා පාලන**
-------------------

පහත දැක්වෙන පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානයක් යොමුකළ යුතුව ඇත.

(අ) ස්ථාවර වත්කම් පාලනය

(ආ) ගිණුම්කරණය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ) ණයගැති/ණයහිමි පාලනය

(ඉ) කාර්ය මණ්ඩල පරිපාලනය

(ඊ) අභ්‍යන්තර විගණනය